# නිදහස් ආර්ථික චින්තනය හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය

කේ.කේ. තරිඳු උදයංග[1]

**සංක්ෂේපය**

නිදහස් ආර්ථික චින්තනය සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය පිළිබඳව විමසීමක් කෙරෙන මෙම ලිපියේ දී, නිදහස් ආර්ථික චින්තනයේ විකාශය මෙන් ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනයෙහි ගති ලක්ෂණ පිළිබඳව පැහැදිලි කෙරේ. නිදහස් ආර්ථික චින්තනය එය රාජ්‍ය නිර්බාධවාදය, නූතන ලිබරල්වාදය මෙන් ම නව ලිබරල්වාදී ආර්ථිකමය ස්වරූපයන්ගෙන් ඉදිරියට විකාශනය වී ඇත. නිදහස් ආර්ථික චින්තනයට අමතරව පසුකාලීනව විශේෂ අවධානයක් යොමු වූ ආර්ථික දර්ශනය වන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය යි. සමාජීය වශයෙන් වඩා යහපත් වූ ගුණාත්මක හා තිරසාර සංවර්ධනයක් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය තුළින් යෝජනා කර ඇති අතර ඒ පිළිබඳ විමසීමක් මෙම ලිපියෙන් ඉදිරිපත් කෙරේ.

**මුඛ්‍ය පදඃ** රාජ්‍ය නිර්බාධවාදය, නව ලිබරල්වාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, සංවර්ධනය

**හැඳින්වීම**

නිදහස් ආර්ථික චින්තනය හරහා ඇඩම් ස්මිත් ප්‍රමුඛ ධනවාදී ආර්ථික ගුරුකුළය පෙන්නුම් කළ ප්‍රධාන තර්කය වූයේ ආර්ථික මිනිසුන් වන නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් ස්වාර්ථය මුල් කරගෙන තමාගේ අභිවෘද්ධිය සඳහා තම උපයෝගීතාව උපරිම වන පරිදි තීන්දු තීරණ ගැනීම නිසා ඔවුන් නොදැනුවත්ව ම සමස්ත සමාජයේ ශුභසාධනය ඉහළ යාමෙන් වර්ධනයක් ඇතිවන බවයි. කෙසේ වෙතත් පසුකාලීනව සමාජවාදී අදහස් සහිත මාර්ක්ස්වාදී ගුරුකුළය ඉදිරිපත් කළ ප්‍රතිතර්කය වූයේ නිදහස් ආර්ථික චින්තනය හරහා සමාජය තුළ ධනපති හා නිර්ධන වශයෙන් පංති දෙකක් නිර්මාණය වන බවත්, නිෂ්පාදන හැකියාව ධනපති පංතිය සතුවන බවත්, එබැවින් පංති විසමතාවක් ඇතිවන බවත් ය. එමෙන් ම ධනපති පංතියට නිෂ්පාදනය දිගුකාලීන වන විට ලාභ උපරිම කිරීම සඳහා ශ්‍රම සූක්ෂම කර්මාන්තවල සිට ප්‍රාග්ධන සූක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියකට විතැන් වීමට සිදුවන බවත් ඒ හරහා විරුකියාව ආදී ආර්ථික ප්‍රශ්න ගණනාවක් ඇතිවන බවයි. මේ හේතුව නිසා රාජ්‍ය නිර්බාධවාදය යටතේ රජය ආර්ථික කටයුතුවලට මැදිහත් නොවුණ ද නූතන ලිබරල්වාදය යටතේ රජය ආර්ථික කටයුතුවලට මැදිහත් විය. එහෙත් රජයේ නිළධාරීන්ගේ අකාර්යක්ෂමතා නිසාත්, රජයේ වියදම් ඉහළයාම නිසාත්, රාජ්‍ය මූල්‍ය කළමණාකරණය දුර්වල විම නිසාත් නූතන ලිබරල්වාදය අකාර්යක්ෂම විය.

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා පළමු වසර, kktudayanga@gmail.com

මේ හේතුව නිසා නව ලිබරල්වාදය ඉදිරිපත් වූ අතර එහ දී රජය ආර්ථික කටයුතුවලට අවම වශයෙන් මැදිහත් වෙයි. එමෙන් ම පෞද්ගලික අංශය දිරිමත් කරන අතර ඔවුන්ට අවශ්‍ය හිතකර ආර්ථික පරිසරය සම්පාදනය කර දෙයි. ඉහළ ආදායම්ලාභී නිෂ්පාදකයන්ගෙන් බදුඅයකරන අතර ඒ ආදායම මගින් ශුභසාධන සේවා පවත්වාගෙන යාමත්, දිළින්දන්ට සමාජ රක්ෂණ දීමනා ලබාදීමත් සිදුකරයි. එම ඉහළ ආදායම් පංතිය බදු ගෙවීම පැහැර නොහැරීම නිසාත් , විරැකියාව හා දුප්පත්කම යම් තරමකට පැවතියත් නිදහස් ආර්ථික චින්තනයේ මූලධර්ම සහිත නව ලිබරල්වාදී ආර්ථික චින්තනය වර්තමාන ලෝකයේ සෑම රටක ම පාහේ යොදා ගැනේ.

ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ක්‍රියාකාරීත්වය ඔස්සේ ගොඩනැගුණු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය නිදහස, සාධාරණත්ව හා සමානාත්මතාව යන කරුණු මත පදනම් විය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනයෙහි මූලිකාංග වූයේ වර්ධනය, සාධාරණත්වය හා තිරසාරබවයි.

## නිදහස් ආර්ථික චින්තනය

ලෝක ආර්ථික ඉතිහාසය දෙස අවධානය යොමුකිරීමේ දී විවිධ ආර්ථික මතවාදයන් හා ආර්ථික ක්‍රම පිළිබඳව හඳුනාගත හැකි ය. වර්ෂ 1935 දී ආතර් බර්නි සඳහන් කළේ ආර්ථික ඉතිහාසය යනු අතීත ආර්ථික ක්‍රම පිළිබඳ වාර්තාවක් බවයි. යුරෝපා රටවල පැවති වැඩවසම් ආර්ථික ක්‍රමය බිඳවැටීමත් සමගම විවිධ ආර්ථික චින්තනයන් ඉදිරිපත් කෙරිණි. ඒවා අතුරින් ආර්ථික චින්තනයක් ලෙස ඇඩම් ස්මිත් ප්‍රමුඛ ධනවාදී ආර්ථික ගුරුකුළය ඉදිරියට ගෙන ආ නිදහස් ආර්ථික චින්තනය කැපී පෙනේ.

නිදහස් ආර්ථික චින්තනයෙහි මූලධර්මය වූයේ ආර්ථික කටයුතුවලින් රජය ඈත් වී ආර්ථික ක්‍රියාකාරනම් නිදහසේ ක්‍රියාත්මක කිරීමට වෙළඳපළට නිදහස ලබා දීමයි. නිදහස් ආර්ථික චින්තනය ප්‍රධාන වශයෙන්ම ලිබරල්වාදී ආර්ථික දර්ශනය මත පදනම් විය.

## නිදහස් ආර්ථික චින්තනයෙහි විකාශනය

නිදහස් ආර්ථික චින්තනයෙහි විකාශනය පිළිබඳ අවධානය යොමුකිරීමේ දී එය ප්‍රධාන වශයෙන්ම අවධි තුනක් යටතේ හඳුනාගත හැකි ය. එනම්,

1- රාජ්‍ය නිර්බාධවාදය.
2- නූතන ලිබරල්වාදය.
3- නව ලිබරල්වාදය.

ඉහත කරුණු තුනෙන් පළමු වැන්න වන රාජ්‍ය නිර්බාධවාදය ඇඩම් ස්මිත් විසින් ඉදිරිපත් කළ නිදහස් ආර්ථික චින්තනයෙහි පළමු අවධියයි.

නිදහස් ආර්ථික චින්තනය යටතේ ගොඩනැගුණු ආර්ථික ක්‍රියාදාමයන්හි විවිධ ගැටළු සහගත තත්ත්වයන්ට විකල්ප වශයෙන් නූතන ලිබරල්වාදය ඉදිරිපත් කෙරුණු අතර පසුකාලීනව නව ලිබරල්වාදය ඉදිරිපත් කෙරිණි. එබැවින් නිදහස් ආර්ථික චින්තනය පිළිබඳව විමසා බැලීමේ දී රාජ්‍ය නිර්බාධවාදය, නූතන ලිබරල්වාදය හා නව ලිබරල්වාදය යන අදියර තුන පිළිබඳවම අවධානය යොමුකිරීම යුක්ති යුක්තය.

රාජ්‍ය නිර්බාධවාදය පිළිබඳ අදහස් ඉදිරිපත් කළේ ඇඩම් ස්මිත් විසිනි. ඔහු විසින් ඉදිරිපත් කරන ලද ජාතීන්ගේ ධනය පිළිබඳ ග්‍රන්ථයෙන් නිදහස් ආර්ථික චින්තනය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ අතර ආර්ථික කටයුතු සඳහා රජය මැදිහත්වීම අඩුවෙන් සිදුවිය යුතු බවට ප්‍රකාශ කරනු ලැබී ය. එනම් ඔහුගේ අදහස Less governance is good governance යන්නයි. මේ වන විට යුරෝපාකරයේ ක්‍රියාත්මක වූ වාණිජවාදය විවේචනයට ලක්කරන ඇඩම් ස්මිත් ප්‍රකාශ කරනු ලැබුවේ ආරක්ෂණවාදය මගින් වෙළඳාම පාලනය කිරීමට වඩා නිදහස් වෙළඳාමට ඉඩහැරීමෙන් නිෂ්පාදනය හා සමාජ ශුභසාධනය යන දෙකම ඉහළ නැංවිය හැකි බවයි. ජාතීන්ගේ ධනය ග්‍රන්ථය ඉදිරිපත් කිරීමට පෙර 1759 දී The theory of moral sentiments නම් ග්‍රන්ථය ඉදිරිපත් කළ අතර එමගින් මිනිසා අනෙකුත් පුද්ගලයන් සමග ප්‍රතික්‍රියා කරමින් ඇතිකරගන්නා සදාචාර ක්‍රම ඔහුගේ හොඳ හෝ නරක හැසිරීමට බලපාන බව ප්‍රකාශ කළ අතර ඒ අනුව සෑම පුද්ගලයෙකුටම නිදහසේ කටයුතු කිරීම ට පූර්ණ නිදහසක් තිබිය යුතු බව ඔහුගේ දර්ශනය විය. ඉන් පසුව ඔහු විසින් ඉදිරිපත් කළ ජාතීන්ගේ ධනය පිළිබඳ ග්‍රන්ථය නිදහස් ආර්ථික චින්තනය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන ලදී. රාජ්‍ය මැදිහත්වීම වැඩියෙන් සිදුවිය යුතු යැයි ඉදිරිපත් කළ වාණිජවාදී චින්තනයන්ට ප්‍රතිවිරුද්ධ චින්තනයන් ඉදිරිපත් කිරීමේදී රජයේ සහයෝගය අපේක්ෂා නොකරන නිෂ්පාදකයන්ගේ ප්‍රබල පෞද්ගලිකත්වය සහ රාජ්‍ය මැදිහත්වීම නිසා සිදුවන අක්‍රමිකතා සැලකිල්ලට ගත් ස්මිත් විසින් ඉදිරිපත් කළ දර්ශනයේ දී මිනිසුන්ගේ පෞද්ගලිකත්වය සහ ආත්මාර්ථකාමී හැඟීම් සැලකිල්ලට ගනු ලැබේ. මේ අනුව එකල බ්‍රිතාන්‍ය සමාජය පදනම් කරගෙන මස් මරන්නන්, මීවිත පෙරන්නන්, සහ බේකරිකරුවන් සිය කටයුතු කරන්නේ අනුනට ඇති දයාව නිසා හෝ මහජන සුබසිද්ධිය සඳහා නොව හුදෙක් ස්වාර්ථය සඳහායි. එහෙත් ඔවුන්ගේ ක්‍රියාකාරකම් තුළින් සමාජයට අවශ්‍ය මස්,වයින් සහ පාන් ආදිය ලැබේ. එමගින් සිදුවන්නේ සමාජ යහපතයි. එනම් මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ඉටුවීමයි. නිෂ්පාදකයින් තම භාණ්ඩ නිපදවන්නේ ඒ සඳහා සමාජයේ ඉල්ලුමක් පවතින නිසාය. මෙම තත්ත්වය පැහැදිලිව නිරීක්ෂණය කළ සමිත් ප්‍රකාශ කළේ කුමන භාණ්ඩ, කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කළ යුතු ද කවුරුන් සඳහා නිපදවිය යුතු ද කෙසේ නිපදවිය යුතු ද යන මූලික ආර්ථික ගැටළු අදෘශ්‍යමානව සිදුවන බවයි. මේ අනුව මහජන ශුභසිද්ධියේ සැඟවුණු රහස හුදෙක් පුද්ගල ආත්මාර්ථයම බව ස්මිත් පෙන්නුම් කරයි. මෙම ක්‍රියාවලිය ස්වභාවික නිදහස් ක්‍රියාවලිය වශයෙන් සලකයි. ස්මිත් විසින් මෙම චින්තනය ඉදිරිපත් කළ කාලවකවානුව වූයේ 1775 ඇමරිකානු විප්ලවය, 1789 ප්‍රංශ විප්ලවය සහ ඊට සමගාමීව බ්‍රිතාන්‍යයේ සිදු වූ කාර්මික විප්ලවය ක්‍රියාත්මක වූ කාලවකවානුව වීම සැලකිය යුතුයි.

වැඩවසම් ක්‍රමය බිඳවැටීම, විද්‍යාත්මක ක්‍රම සොයා ගැනීම, අධිරාජ්‍යවාදයට එරෙහි වීම සහ කාර්මික අංශයේ නිෂ්පාදන හා රැකියා සඳහා යොමුවීම වැනි ක්‍රියාවලිවල ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් ව්‍යාප්තවන යුගයක් වීම ස්මිත්ගේ චින්තනය කෙරෙහි බලපෑමක් ඇතිකර ඇති බව පෙන්නුම් කරයි. ඒ අනුව ස්වභාවික නියමයන්ට අමතරව මානව ආර්ථික කටයුතු විශ්ලේෂණයට විද්‍යාත්මක පසුබිමක් ඇතිකිරීමට ඇඩම් ස්මිත්ට හැකි වේ.

**රාජ්‍ය නිර්බාධවාදයේ සංකල්පීය පදනම**

මේ අනුව රාජ්‍ය නිර්බාධවාදයේ සංකල්පීය පදනම සැලකුවහොත් මූලික වශයෙන් කරුණු තුනක් මත පදනම් වේ. (හේනේගෙදර, 2016)

- දේපළ සුරුකීම.
- ප්‍රාග්ධන සම්පාදනය.
- ශ්‍රම විභජනය.

මෙම කරුණු තුනම ධනවාදී ආර්ථික චින්තනයේ ප්‍රධාන අංගයන්වන අතර ශ්‍රම විභජනය පිළිබඳ සංකල්පය වඩාත් පුළුල් ලෙස විස්තර කර ඇත. සංවර්ධනයේ ප්‍රධාන සාධකය ශ්‍රම විභජනය සහ විශේෂ ප්‍රාගුණ්‍ය සිදුකළ යුතු බවට පෙන්නුම් කළ ස්මිත් එමගින් ඵලදායීතාවය වැඩිකොට ඒකක පිරිවැය පහත හෙළිය හැකි බව පෙන්නුම් කරනු ලැබේ. ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අදහස් ඉදිරිපත් කළ ස්මිත් ස්වභාවික වාසි මත ශ්‍රම විභජනය සහ ප්‍රාගුණ්‍ය කිරීමෙන් වෙළඳාමට සම්බන්ධවන දෙපාර්ශවයටම වාසි අත්කරගත හැකි බව පෙන්නුම් කරනු ලැබේ. එසේම මේ කාලය වන විට බ්‍රිතාන්‍යයේ සිදු වෙමින් පැවති වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටීම සහ කාර්මීකරණයට පත් වීම නිසා ඇතිවෙමින් පැවති ව්‍යාකූලත්වයට පත් ආර්ථික කටයුතු පැහැදිලි කිරීමට ශ්‍රමය පිළිබඳ වටිනාකම් න්‍යාය ඉදිරිපත් කරනු ලැබීය. මෙමගින් ඔහු පැහැදිලි කළේ භාණ්ඩයක නිමවූ පිරිවැය සහ මිල තීරණය කිරීමට බලපාන එකම සාධකය එම භාණ්ඩය සෑදීමට වැය කරන ශ්‍රමයේ වටිනාකම හෙවත් ශ්‍රමයේ පිරිවැයයි. සැපයුම පදනම් කරගත් ස්මිත්ගේ වර්ධන ආකෘතිය අනුව ජනගහනය, භූමිය හා ප්‍රාග්ධනය යන සාදක මත නිෂ්පාදනය තීරණය වන අතර ඒ අනුව එම සාධකයන් පාලනය කිරීම හෝ අඩුවැඩි කිරීම ආර්ථික වර්ධනයට බලපානු ලබයි. රටක වැඩිවන ශ්‍රම බලකාය නඩත්තු කිරීමට හෝ පවත්වා ගෙන යාමට ඇති හැකියාව මත සමාජය රඳා පවතින අතර ඉතිරිකිරීම් මත ආයෝජන තීරණය වනක බව පෙන්නුම් කරනු ලැබේ. මෙලෙස නිදහස් චින්තනයේ සරලතාව පැහැදිලි කල ස්මිත් ඉල්ලුම් හා සැපයුම් බලවේග අනුව මිල යන්ත්‍රණය මගින් ආර්ථිකය ස්වභාවිකව හැසිරෙන ආකාරය පෙන්වා දුන් අතර එමගින් පුදුගල අභිමතාර්ථය මෙන්ම සමාජ අභිමතාර්ථයන් ද ඉටුවන බව පෙන්නම් කළේය. මෙලෙස මිල යන්ත්‍රණයේ රහස නිදහස් තරගය බව අවබෝධ කරගත් පසුකාලීන ආර්ථික විද්‍යාඥයෝ රාජ්‍ය නිර්බාධවාදය ක්‍රියාත්මක කිරීමට සෑම අනුබලයක්ම දෙන ලදී. මේ අනුව ඩේවිඩ් රිකාඩෝ , රොබට් මෝල්තස්, ස්ටුවර්ට් මිල් වැනි ආර්ථික විද්‍යාඥයන් විසින් මෙම චින්තනය වැඩිදියුණු කරන ලදී.

1780 දී බ්‍රිතාන්‍යයේ බලයට පත් අගමැති විලියම් පිට් විසින් ස්මිත් ගේ චින්තනය අනුව බදු යෝජනා ක්‍රියාත්මක කළ අතර නිදහස් වෙළඳාම සඳහා සෑම අනුබලයක්ම සපයන ලදී. එසේම බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ සිටි එඩ්මඩ් බර්ක් විසින් ස්මිත්ගේ චින්තනය අගය කරන අතර ඒ අනුව රාජ්‍ය නිර්බාධවාදය සඳහා දාර්ශනික පිළිගැනීමක් ලැබුණි. මෙහිදී අවධානය යොමුකළ යුතු කරුණක් වන්නේ ස්මිත් විසින් රාජ්‍ය මැදිහත්වීම සම්පූර්ණයෙන්ම බැහැර නොකළ බවයි. නීත්‍යානුකූලව රජයක් විසින් ඉටුකළ යුතු කරුණු තුනක් පිළිබඳව ස්මිත් අවධාරණය කර ඇත.

- නිශ්චිත පොදු ආයතන ඇති කිරීම හෝ පවත්වා ගෙන යාම.
- නිමවුම් හා සැපයුම් පාලනයට ඇතිකරගන්නා සන්ධාන නොතිබිය යුතුය.
- මිල ඉහළ නංවන ඒකාධිකාරී තත්ත්වයන් ඇති නොවීමට කටයුතු කළ යුතුය.

**රාජ්‍ය නිර්බාධවාදයේ පදනම**

ඉහත කරුණු වලින් පැහැදිලි වන්නේ නිදහස් චින්තයක් වශයෙන් රාජ්‍ය නිර්බාධවාදය ක්‍රියාත්මක වුවත් අවශ්‍ය අවස්ථාවලදී රජය මැදිහත් විය යුතු බවයි. රාජ්‍ය නිර්බාධවාදයේ පදනම ලෙස පිළිගත් ප්‍රධාන කරුණු හතරකි.

- පුද්ගලයා සමාජයේ මූලික ඒකකය විය යුතුය.
- පුද්ගලයාට නිදහස සඳහා ස්වභාවික අයිතියක් ඇත.
- ස්වභාවධර්මයේ භෞතික පැවැත්ම ස්වයංපාලන ක්‍රමයක් හා පොදු ක්‍රමයක් විය යුතුය.
- සහයෝගීතාවයන් රජය මගින් ඇති කළ යුතු අතර එය සමීප ලෙස විමර්ශනය කළ යුතුය.

**රාජ්‍ය නිර්බාධවාදයේ බිඳවැටීම**

කෙසේ නමුත් වාණිජවාදය මෙන් දිගුකාලයක් රාජ්‍ය නිර්බාධවාදය ක්‍රියාත්මක නොවීය. මෙයට මූලික හේතුව වූයේ පැවති සමාජ විශමතා සහ ස්වභාවික හේතුන් මත රජයට මැදිහත්වීමට සිදුවුවත් අනෙක් අතට ආර්ථික විද්‍යාවේ මුල් අවස්ථාවේ දී ඉදිරිපත් කරන ලද න්‍යායන් නිසා ආර්ථික විද්‍යාව හෝ පෞද්ගලීකරණය පිළිබඳ මිනිසුන්ගේ පැහැදීම අඩුවීමයි.

විශේෂයෙන්ම මේ යුගයේ දී ආර්ථික විද්‍යාඥයන් ඉදිරිපත් කළ ආර්ථික විද්‍යා න්‍යායන් හේතු කොට ගෙන සමාජය තුළ මෙම ආර්ථික න්‍යාය පිළිබඳ බියක් හට ගැණිනි. ඩේවිඩ් රිකාඩෝ විසින් ඉදිරිපත් කළ ආර්ථික විද්‍යා මූලධර්ම හා අයබදු ප්‍රතිපත්ති කෘතියෙන් අනාගත ආර්ථික වර්ධනය හා සංවර්ධනය පිළිබඳ අසුබදායි විස්තරයක් ඉදිරිපත් කර තිබේ.

මෙමගින් ඔහු ඉදිරිපත් කළ හීනවන ආන්තික ඵලදායිතා න්‍යාය අනුව භූමියේ ඵලදාව වැඩිකිරීම සීමිත බවත් එමනිසා ඉඩම් හිමියන් අයකරන බදු ඉහළ යාමෙන් ආහාර මිල වැඩිවන අතර අතිරික්ත ශ්‍රම බලකායක් සිටීම නිසා කිසියම් අවස්ථාවකට පසු අතරික්ත ඵලදාව ඍණ තත්ත්වයකට පත්විය හැකි බවත් පැහැදිලි කෙරිණි. මීට අමතරව 1978 දී රොබට් මෝල්තස් ඉදිරිපත් කරන ලද ජනගහන වර්ධනය පිළිබඳ න්‍යාය ද සමාජය තුළ බිය උපදවන ලදී. රටේ ජනගහන වර්ධන වේගයට සාපේක්ෂව ඉඩම් ප්‍රමාණය වර්ධනය නොවීමෙන් ප්‍රමාණවත් ආහාළු නිෂ්පාදනයක් සිදු නොවීමෙන් ජනගහනය පීඩවට පත්වන නිසා ස්වභාවික ක්‍රමවේදයක් මගින් උපත් පාලන කටයුතු සිදු කිරීමට ජනතාව පෙළඹවිය යුතු බවට මෙම න්‍යායෙන් වැඩිදුරට පැහැදිලි කෙරිණි. මේ අනුව 19 වන සියවස අගභාගය වන විට බ්‍රිතාන්‍යයේ රාජ්‍ය නිර්බාධවාදය අක්‍රියකාරී වන අතර විවිධ අන්දමින් රාජ්‍ය ආර්ථික කටයුතු වලට මැදිහත් වේ. නිර්බාධවාදය නිසා කර්මාන්ත හා වාණිජ අංශවල වර්ධනයක් දැකිය හැකි වුවත් කම්කරු ආරවුල් ඇති වීම නිසා ඒ සඳහා මැදිහත්වීමට රජයට සිදු වේ. එසේම ළමා හා කාන්තා ශ්‍රමය භවිත කිරීම, අඩු පහසුකම් යටතේ දිගු කාලසීමාවක් සේවයේ යෙදවීම වැනි කරුණු රාජ්‍ය මැදිහත්වීමට වඩාත් හේතු විය. මේ අනුව 1802,1937 කාලයේ දී බ්‍රිතාන්‍ය රජය විසින් පනවන ලද අණපනත් ගණනාවක් මගින් සේවා තත්ත්වය වර්ධනය කිරීම, වැටුප් හා වැඩකරන පැය ගණන නියම කිරීම සිදු විය. ඒවා අතර,

- 1833,1844,1878,1890 කර්මාන්තශාලා අණපණත්.
- 1896 කම්කරු ආඥා පනත.
- 1909 විශ්‍රාම වැටුප් පනත.
- 1910/1918 වෙළඳ මණ්ඩල පනත.
- 1911 ජාතික ආරක්ෂණ යෝජනා පනත්
- 1834,1911,1930 කාලවලදී ක්‍රියාත්මක කළ දුගී නීති පනත්
- 1865-1921 දුම්රිය අණපනත් වැදගත් වේ.

මීට අමතරව බ්‍රිතාන්‍යයේ ක්‍රියාත්මක වූ රාජ්‍ය නිර්බාදවාදය බිඳවැටීමට හේතු වූ තවත් කරුණු කීපයක් පහත පරිදි පෙළගැස්විය හැකිය. ඒවා නම්,

- තරගකාරීව හුදු ලාභ අපේකෂාවෙන් පමණක් නිෂ්පාදනයට සම්පත් යෙදවීමෙන් සම්පත් නාස්තිය ඉහළ යයි.
- රජය මැදිහත්වීම අඩුවීමත් සමග බ්‍රිතාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ බිඳවැටීමක් සිදුවන අතර රජය මැදිහත් වී අධ්‍යාපනය දියුණු කිරීමට සිදු වීම.
- 1930 ගණන්වල යුරෝපයේ ඇති වූ ආර්ථික පරිහානිය නිසා රජය අනිවාරයෙන් මැදිහත්විය යුතු බවට කේන්ස් වැනි ආර්ථික විද්‍යාඥයන් උපදෙස් දීම.

- 19වන සියවසේ මුල් කාලයේ දී සිදු වූ පළමු වන හා දෙවන ලෝක යුද්ධ නිසා බොහෝ රටවල් විසින් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ධනවාදී අර්ථ ක්‍රමය පිළිබඳ මාර්ක්ස්ගේ විශ්ලේෂණය.

මේ යටතේ වැදගත් වන ප්‍රධාන කාරණා 3කි. ඒවා නම්,

1- අතිරික්ත වටිනාකම් පිළිබඳ න්‍යාය.
2- ධනය සංකේන්ද්‍රණය වීම හෙවත් ප්‍රාග්ධන රාශීකරණය.
3- පරත්වාරෝපණය හෙවත් පන්ති සටන පිළිබඳ අදහස.

මාර්ක්ස්ට අනූව ශ්‍රමයේ වටිනාකම භාවිත වටිනාකම හා හුවමාරු වටිනාකම වශයෙන් කොටස් දෙකකි.භාවිත වටිනාකම යනු භාණ්ඩයක් නිපදවීමට කම්කරුවා දරන ශ්‍රමයේ වටිනාකමයි. හුවමාරු වටිනාකම යනු වෙනත් භාණ්ඩයක් සමග හුවමාරු කිරීමේ දී ඇතිවන වටිනාකමයි. ශ්‍රමයේ හුවමාරු වටිනාකම එහි භාවිත වටිනාකමට වැඩි බව පෙන්වා දෙන මාර්ක්ස් ශ්‍රමිකයා දරන වැටුපට වඩා වැඩි වටිනාකමක් භාණ්ඩයේ වටිනාකමට එක් කර ඇති බවත් එම අතිරික්ත ශ්‍රම වටිනාකම නිෂ්පාදකයාගේ ලාභය බවට පත්වන බවත් එය සූරාකෑම බවත් පවසයි. අතිරික්ත ශ්‍රම වටිනාකම් තුළින් ලබා ගන්නා ලාභය නිසා ප්‍රාග්ධනය ජනිත වන බවත් එමනිසා වැඩි වශයෙන් ශ්‍රමය සූරාකෑමෙන් අතිරික්තය ජනිත කර ලාභ ලබාගැනීමට නිෂ්පාදකයා කටයුතු කිරීම මගින් ප්‍රාග්ධන සම්පාදනය සිදුවන බව මාර්ක්ස් පෙන්වා දෙන ලදී. එමෙන්ම සමාජයේ පන්තිවල යාන්ත්‍රික ස්වරූපය නිසා පුද්ගලයින් මානව ගති ලක්ෂණවලින් ඉවත් වීමයි. එය සිදුවන්නේ තමා නිෂ්පාදනය කළ භාණ්ඩවල අයිතිය තමාගෙන් ඉවත් වි අනුන් සතුවීම නිසාය.

උක්ත කරුණු කාරණා පදනම් කරගෙන රාජ්‍ය නිර්බාධවාදී ආර්ථික සංකල්පයට එහා ගිය නව ආර්ථික චින්තනයක් ලෙස නව ලිබර්ල්වාදී ආර්ථික දර්ශනය ඉදිරිපත් විය. රාජ්‍ය නිර්බාදවාදයේ දී රජය ආර්ථික කටයුතු වලට මැදිහත් නොවුණ ද නව ලිබර්ලවාදය තුළින් රජය අවම වශයෙන් මැදිහත් විය. විශේෂයෙන්ම එහි දී රජය සුභසාධන සේවා සැපයීම සඳහා කටයුතු කළ අතර පෞද්ගලික අංශයට හිතකර ව්‍යාපාරික පරිසරයක් පවත්වා ගැනීම සඳහා ද කටයුතු කරන ලදී. රාජ්‍ය නිර්බාධවාදී ආර්ථික දර්ශනය මත පදනම්ව ඉදිරියට පැමිණ නව ලිබරල්වාදී ආර්ථික දර්ශනය ප්‍රධාන වශයෙන්ම කරුණු පහක් මත පදනම් වේ. ඒවා නම්,

1- පෞද්ගලීකරණය
2- මුදල් අරපිරිමැස්ම
3- නියාමනහරණය
4- නිදහස් වෙළඳාම
5- රජයේ වියදම් අඩුකිරීම

මේ අනූව නිදහස් ආර්ථික චින්තනය රාජ්‍ය නිර්බාධවාදය, නූතන ලිබරල්වාදය හා නවලිබරල්වාදය හරහා ඉදිරියට විකාශනය වූ අතර වර්තමාන ලෝකයේ බොහෝ රටවල ඉතා කාර්යක්ෂම ආර්ථික චින්තනයක් ලෙස මෙය යොදා ගැනේ.

විශේෂයෙන්ම මාර්ක්ස්වාදීන් නිදහස් ආර්ථික චින්තනයට විරුද්ධව පළ කළ මතවාදයන්ට විකල්පයන් ලෙස නව ලිබරල්වාදය පෝෂණය වූ අතර මෙහි දී ධනපති ව්‍යාපාරික ප්‍රජාව බදු ගෙවීම් පැහැර නොහැරීම හේතුවෙන් සමාජ රක්ෂණ දීමනා දිළිඳු කොටස් වෙත දිගින් දිගටම ලබා දීමට බොහෝ රටවලට හැකිව තිබේ. එබැවින් නිදහස් ආර්ථික චින්තනය ලෝකයේ බොහෝ රටවල ඉතා කාර්යක්ෂම ලෙස ආර්ථිකය කළමණාකරණයේ දී යොදා ගැනේ.

### සමාජ ප්‍රජාතන්ත්‍රවාදී අර්ථික දර්ශනය

යුද්ධයෙන් පසු කාලයේ දී ජර්මානු ෆෙඩරල් ජනරජය හරහා ඉස්මතු වූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය ජර්මනියේ  නව යුගයක් ඉස්මතු කරලීමට හේතු සාධක විය. ජර්මනියේ නාසි පාලනය හරහා ඇතිවුණ තැතිගැන්ම මෙන්ම ශීඝ්‍ර කාර්මීකරණය හේතුවෙන් උත්ගත වූ ගැටළු සඳහා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික සංකල්පය විසඳුම් සැපයීය. නිදහස් ධනේෂ්වරවාදය හා සමාජවාදය අතර නව ආර්ථික සංකල්පයක් මෙම සමාජ වෙළඳපළ ආර්ථිකය හරහා ගම්‍යමාන විය. වෙළඳපළ ආර්ථිකයත්, ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පයත් යන දෙකේම ගතිලක්ෂණ සමාජ වෙළපළ ආර්ථිකය තුළින් විද්‍යමාන විය.

වර්ෂ 1947 දී Alfred Muller Armack නම් ආර්ථික විද්‍යාඥයා විසින් රචනා කළ ආර්ථික කළමණාකරණය හා වෙළඳපළ ආර්ථිකය නම් ග්‍රන්ථය සමාජ වෙළඳපළ ආර්ථිකය කෙරෙහි පදනම සපයනු ලැබීය. ඔහු එහි දී සඳහන් කර ඇත්තේ සමාජ වෙළඳපළ ආර්ථිකය යනු තුන්වන ආර්ථික ප්‍රතිපත්තිය ලෙසයි. එමෙන් ම එය ලිබරල් වෙළඳපළ ආර්ථිකය නොවන අතර සමාජයීය වශයෙන් මනා ලෙස කළමණාකරණය කරන ලද අනාගත ආර්ථික සංවර්ධනයට පිටිවහලක් වන ආර්ථික ක්‍රමවේදයක් බවත් සඳහන් ය.

ඒ අනුව සමාජ ප්‍රජාතන්ත්‍රීය ආර්ථිකය තුළ එක් අතකින් වෙළෙඳපොළෙහි සැබෑ තරගයත්, නිදහස් මිලත්, නිෂ්පාදනය සම්බන්ධ පෞද්ගලික හිමිකාරීත්වයත් පවතින අතර අනෙක් අතින් සමාජ සාධාරණත්වය, ඵලදායී බදුකරණය, පවතී. ලිස්බන් ගිවිසුමෙහි විස්තර කර ඇති පරිදි සමාජ වෙළෙඳපොළ ආර්ථිකය යන්න යුරෝපා ජාතීන්ගේ අරමුණයි. කෙසේවෙතත් ප්‍රජාතන්ත්‍රවාදය තීරණාත්මකව ස්ථාපනය කළ නව මධ්‍යම පන්තියක් බිහිකරලීමට මෙම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථිකයට හැකියාව ලැබිණි. සමාජ ප්‍රතිපත්තින් හා රීතීන් මෙන්ම වෙළඳපළ ආර්ථිකය යන සංකල්පයන්ගෙන් සැදුම්ලත් සමාජ ප්‍රජාතන්ත්‍රීය ආර්ථික ක්‍රමවේදය ජර්මානු ආර්ථික සංවර්ධනයට පදනම විය.

### සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තිය

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳව විවරණය කිරීමේ දී එම ප්‍රතිපත්තියෙහි අන්තර්ගත මූලික අරමුණු කෙරෙහි අවධානය යොමුකළ යුතුය. ඒ අනුව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තියෙහි හඳුනාගත හැකි මූලික අරමුණු තුනකි. ඒවා නම් ,

1- නිදහස
2- සාධාරණත්වය
3- සහයෝගීතාවය

මෙම අරමුණු අතර සමාන වැදගත්කමක්, එකිනෙක අතර බැඳීමක් පවතී.

නිදහස යන්නෙන් අදහස් කරනු ලබන්නේ ස්වාධීනව තීරණය කරගත් ජීවිතයක් ගතකිරීමේ අවස්ථාවයි. ආර්ථික හා සමාජීය සාධකයන් ස්ථාවරව පවතින විට මෙම නිදහස යන සංකල්පයන් තහවුරු වේ.

සාධරණත්වය රැඳී පවතිනුයේ සමාන ගරුත්වය මතයි. ස්ත්‍රී පුරුෂභාවය, පවුල් පසුබිම ආදිය නොසලකා සමාජීය ආරක්ෂාව හා සහභාගීවීමේ අවස්ථා පුළුල්වීම මගින් සාධරණත්වය ගොඩනැගේ.

තවත් පුද්ගලයන් වෙත උදව් කිරීමට ජනතාවට ඇති කැමැත්ත මත සහයෝගීතාවය පදනම් වේ. සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ ජොහැන්ස් රාඕ ප්‍රකාශ කර ඇත්තේ සමාජ ඒකාබද්ධතාවය සඳහා හේතුවන බැම්ම සහයෝගිතාවය බවයි.

වර්ෂ 1863 දී ෆර්ඩිනාඩ් ලාසෙල් (Ferdinand Lassalle) ස්ථාපනය කළ ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (Social Democratic Party–SDP) මූලිකාංග වූයේ නිදහස, සමානත්මතාවය හා සහයෝගීතාවයයි. (Camerra R.P. 2004) 1959 දී ගොඩ්ස්බර්ග් වැඩසටහන :Godesberg Programme ) යටතේ SDP පක්ෂය මෙම අරමුණු ගොඩනැංවීය. SDP පක්ෂය පසුකාලීනව ජර්මනියේ ක්‍රියාත්මක කරන ලද හම්බර්ග් වැඩසටහන තුළ දී (Hamburg Programme, 2007) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය හඳුන්වා ඇත්තේ පහත පරිදි ය.

> *“ In our understanding markets are a necessary form of economic coordination and superior to the alternatives. Markets left to their own devices, however, are both socially and environmentally blind. They are unable by themselves to provide public goods in sufficient quantities. If markets are to fulfill their potential, they need the regulation of a state which is able to apply sanctions, effective laws fair prices (Hamburg Programme 2007 : 17 )”*


**සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තියෙහි මූලිකාංග**

නිදහස, සාධාරණත්වය හා සහයෝගීතාවය යන අරමුණු ද සහිතව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී ප්‍රධාන මූලිකාංග තුනක් සාක්ෂාත් කරගත යුතු ය. ඒවා නම්,

1- වර්ධනය
2- සමාජ සාධාරණත්වය
3- තිරසාරබව

ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී මෙම මූලිකාංග 3 කෙරෙහි සමාන සැලකිල්ලක් දැක්වීම සමාජ ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා හේතුවෙයි.

ධනේෂ්වරවාදී ආර්ථික චින්තනයේ දී මෙම මූලිකාංග තුනෙන් අවධානය යොමු කළේ වර්ධනය යන සංකල්පය සඳහා පමණි. එබැවින් පොදු යහපත උදෙසා ගුණාත්මක ආර්ථික සංවර්ධනයක් ළඟාකර ගැනීමට ඉහත මූලිකාංග තුන කෙරෙහි සමබර බර තැබීමක් කළ යුතු බව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනයෙන් පැහැදිලි කෙරේ. ඕනෑම ආර්ථික ප්‍රතිපත්තියක ගුණාත්මකභාවය ඉහත මූලිකාංග කෙරෙහි දක්වන අවධානය මත තීරණය කෙරේ. එබැවින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනයෙහි ක්‍රයා පිළිවෙත මෙම මූලිකාංග මත ගොඩනැගී තිබේ.




රටක දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ආර්ථික වර්ධනය ලෙස සරලව අර්ථ දැක්විය හැකි ය. එහෙත් මෙහි දී ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සමාන ලෙස බෙදී යා යුතු අතර ආදායම් බෙදී යාමේ විශමතාවය අවම විය යුතු ය. සමෘද්ධිමත්භාවය ගොඩනැංවිය යුතු ය. විශේෂයෙන්ම තනි පුද්ගලයාගේ ධනය ඉහළ නැංවීම මෙන්ම අනෙක් අතට සමස්තයක් ලෙස සමාජයීය සමෘද්ධිය ඉහළ නැංවීම ද වැදගත්ය. 1972 දී ඉදිරිපත් වූ වර්ධනයේ සීමා නම් ග්‍රන්ථය මගින් පැහැදිලි කරන ලද්දේ වර්ධනය තුළ දී සම්පත් පරිභෝජනය ප්‍රශස්ත ලෙස සිදුවිය යුතු බවයි. ජර්මනියේ ක්‍රියාත්මක වූ හම්බර්ග් වැඩසටහනේ දී වර්ධනය පිළිබඳව අදහස් දක්වා ඇත්තේ මෙසේය.

*"Wealth and the high quality of life have always been priorities in Social Democratic Economic Policy. In the past, progress was understood mainly in terms of quantitative growth. Nowadays we are forced by rapid climate change the overburdening of eco systems and the growth of world population to give development a new, future oriented direction. We want sustainable progress, a dynamic economy, social justice and environmental responsibility in unison. This requires Qualitative growth in combination with reduced consumption of resources" (Hamburg Programme 2007).*

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ධනය හා ජීවන තත්ත්වයෙහි ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කෙරේ (Camerra R.P.2004). අතීතයේ දී වර්ධනය ලෙස හඳුනාගත්තේ ප්‍රමාණාත්මක වර්ධනයයි. වර්තමානයේ දී මුහුණපාන දේශගුණ විපර්යාස, ජෛව පද්ධතිවල ගැටළු මෙන්ම ජනගහන වර්ධනය හේතු කොට ගෙන පරිසරය කෙරෙහි ද අවධානය යොමු කරන ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවිය යුතු බව මෙහි සඳහන් ය.

ආර්ථික වර්ධනයත් සමග සමානාත්මතාවය හා සමාජ සාධාරණත්වය ද සහතික විය යුතු බව මෙහි දී තවදුරටත් වැදගත් වේ. සමාජීය හා ප්‍රජාතන්ත්‍රීය ජීවිතයකට පිවිසීමටත්, වෙළඳපළ සාර්ථකභාවයටත්, ඒ යටතේ ඉඩ සැලසෙන බව සමාජ ප්‍රජාතන්තවාදී ආර්ථික ප්‍රතිපත්තිය තුළ විශ්වාස කෙරේ.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තිය තුළ තෙවනුව වැදගත් වන මූලිකාංගය වන්නේ තිරසරභාවයයි. පරිසරය, ආර්ථිකය හා සමාජීය ක්ෂේත්‍රය යන පැතිකඩ තුනම මීට අයත් ය. ආර්ථික ක්‍රියාකාරකම් සමග ඇතිවන පාරිසරක ගැටළු තිරසරභාවය සමග බැඳී පවතී. අනාගතය සඳහා සම්පත් සංරක්ෂණය කරමින් වත්මන් මානව අවශ්‍යතා සඳහා සම්පත් කාර්යක්ෂම ලෙස උපරිම ඵලදායීතාවයෙන් භාවිතය මෙහිදී වැදගත්ය. තිරසරබව පිළිබඳ අදහස මුලින්ම ඉස්මතු වූයේ 1983 දී බෲට්බන්ඩ් කොමිසම හරහාය. විශේෂයෙන්ම ජර්මනිය තුළ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය ඔස්සේ ආර්ථික තිරසරභාවය කෙරෙහි අවධානය යොමු කරන ලදී.එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී විවිධත්වය, පාරිසරක චිරස්ථිතිය, සමාජ ඒකාබද්ධතාවය, සංස්කෘතික සහභාගිත්වය යන අරමුණු ද මේ යටතේ සාධනය වේ.

1973 දී වර්ධනය හා තිරසරබව පිළිබඳ මූලිකාංග පිළිබඳව අදහස් ඉදිරිපත්කරමින් විලී බැන්ඩ්ට් :Willy Brand) ප්‍රකාශ කළේ ගුණාත්මක වර්ධනය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්තිය මගින් උදාකරගත යුතු බවයි. දරිද්‍රතාවය, සූරාකෑම දුරුකරමින් ඉහළ ගණාත්මක ජීවන තත්ත්වයක් උදාකරලීමටත් අනාගතය සඳහා සම්පත් සංරක්ෂණයටත් මේ යටතේ උත්සාහ ගනී. ගුණාත්මක වර්ධනය පිළිබඳව හම්බර්ග් වැඩසටහනේ දී පහත පරිදි විස්තර කර තිබේ.

*"We are looking for sustainable progress, combining economic dynamism, social justice and environmental common sense. By means of qualitative growth we wish to overcome poverty and exploitation, make possible prosperity and decent work for all and do something about looming climate change. It is important also to safeguard the natural bases of life for future generations and to improve the quality of life. To that end we wish to put the possibilities opened up by scientific and technological progress in the service of humanity" (Qulitative Growth in the SDP's Hamburg Programme).*

**සමාලෝචනය**

සමාජවාදී හා කෙන්සියානු ආර්ථික දර්ශනයන් අභිබවා නිදහස් ආර්ථික චින්තනය ලොව පුරා ප්‍රචලිත වී ඇති අතර නිදහස් ආර්ථික චින්තනය පදනම්කොටගත් නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තීන් වර්තමානය වන විට ලොව පුරා රටවල භාවිතයට ගැනේ. ධනවාදී හා සමාජවාදී ප්‍රතිපත්තීන් සම්මිශ්‍රිතව ඇති සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය ගුණාත්මක හා තිරසාර ආර්ථික සංවර්ධනයකට අවශ්‍ය පසුබිම සකසයි. නිදහස් ආර්ථික චින්තනයෙන් අපේක්ෂිත ආර්ථික වර්ධන උපාය මාර්ග ඉක්මවා ගිය සමාජීය වශයෙන් වඩා යහපත් වූ ගුණාත්මක හා තිරසාර සංවර්ධනයක් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික දර්ශනය තුළින් යෝජනා කර තිබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

හේනේගෙදර පී.එම්. (2016) ආර්ථික චින්තනය හා දියුණු රටවල් 7 ක ආර්ථික සංවර්ධන ඉතිහාසය, ගොඩගේ මුද්‍රණාලය, කොළඹ.

Camerra R.P. (2004) Agenda 2010: Redefining German Social Democracy, German Politics and Society, 22:1, 70,

Spring.Carlsson, I & Lindgren, A. (1998) What is Social Democracy? Stockholm: Swedish Social Democratic Party.

Bertell O. (1999) Market Economy : Advantages and Disadvantages.

Economics and Social Democracy (2011), division for International Cooperation,Berlin